# ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මම

කාලය පිළිබඳ අදහසක්, සංකල්පයක්, සිංහල බෞද්ධයන්ට අනුව නම් පසද්සදත්තියක්, ඇතිකරගැනීමට බොහෝ සංස්කෘතීන් සමත්වී ඇති නමුත් එසේ කිරීමට නොහැකි වූ සංස්කෘතීන් තිබෙන්නට ඇත. අද එවැනි සංස්කෘතියක් ඇත් ද යනු සැකසහිත වන්නේ මේවන විට බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය තම කාලය පිළිබඳ සංකල්පය එසේ කාලය පිළිබඳ සංකල්පයක් ඇතිකරගෙන නොතිබූ සංස්කෘතීන්ට ද දී ඇතැයි සිතීමට හැකි බැවින් ය. එහෙත් අප අවධාරණය කරන්නේ කාලය පිළිබඳ සංකල්පයක් ඇතිකරගැනීම සංස්කෘතියක අනිවාර්ය අංගයක් නොවන බව ය.

එමෙන්ම සියළු සංස්කෘතීන්හි ඇත්තේ කාලය පිළිබඳ එකම සංකල්පය යැයි ද උපකල්පනය නොකළ යුතු ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කාලය යන්න අනෙක් සංස්කෘතීන්ගේ කාලය යන්නෙන් යම් ප්‍රමාණයකට හෝ වෙනස්බව සිංහලයෙහි ක්‍රියාපදවල අතීත හා වර්තමාන රූප පමණක් තිබීමෙන් පැහැදිලිවෙයි. ලතින් වැනි ඇතැම් භාෂාවක ක්‍රියාපදයට කාලය සම්බන්ධයෙන් ගත්කල රූප හයක් වෙයි. පාලි භාෂාවෙහි එලෙස රූප තුනක් වෙයි. සිංහල භාෂාවෙහි ද රූප තුනක් ඇතැයි පෙන්වීමට පැරණි උගතුන් උත්සාහ ගන්නට ඇත්තේ පාලි හා සංස්කෘත භාෂාවල ආභාසයෙන් විය හැකි ය.

කෙසේවෙතත් කාලය පිළිබඳ සංකල්පය නොමැති බ්‍රහ්ම ලෝක ඇති බව අපි සඳහන්කෙළෙමු. මනස වර්ධනයවත්ම බොහෝ සංකල්ප අපට අවශ්‍ය නොවන්නේ යැයි සිතිය හැකි ය. සංකල්ප ඇසුරෙන් සිතීම ම නොදියුණු මනසක ස්වභාවය යැයි ගත හැකි ය. අනෙක් අතට එතරම් වර්ධනය නොවූ මනස්වලට ද සංකීර්ණ සංකල්ප ඇතැයි සිතිය නො හැකි ය. සාමාන්‍ය සංකල්ප නිර්මානය සාමාන්‍ය මනස්වල ලක්‍ෂණයක් වෙයි. එහෙත් මම යන සංකල්පය කිසියම් ආකාරයකට හෝ නැති සත්ත්වයකු සසර සැරිසරන්නේ නැත. සසර සැරිසරන සෑම සත්ත්වයකුට ම කිනම් ආකාරයකින් හෝ මම යන සංකල්පය තිබිය යුතු ය. නො එසේ නම් ඒ සත්ත්වයා නිවන් අවබෝධ කළ යුතු ය.

ළදරුවන්ට කාලය පිළිබඳ සංකල්පය වෙයි ද? පෙර භවයක සිට ගෙනැවිත් ඇති කාලය පිළිබඳ සංකල්පයක් නොමැති නම් ළදරුවකුට කාලය පිළිබඳ සංකල්පයක් ඇතැයි සිතිය නො හැකි ය. එයට හේතුව කාලය පිළිබඳ සංකල්පය නිර්මානයකිරීම ම සංකීර්ණ ක්‍රියාවලියක් වන බැවින් ය. ළදරුවකුට පටිසන්ධි චිත්තය ඇතිවූ මොහොතෙහිම අනිවාර්යයෙන් ම ඇති සංකල්පය නම් “මම” හෙවත් තමා යන්න ය. චිත්තයක් ඇතැයි කී විගස ම මනසක් ඇතැයි ගම්‍ය වෙයි. චිත්තය යනු මනසට ගතහැකි කුඩාම ධර්මය වෙයි. එනම් චිත්තය යනු මනසට සාපේක්‍ෂව ඇති කුඩාම ධර්මය වෙයි. ථෙරවාද අභිධර්මයෙහි චිත්ත, චෛතසික, රූප යනු මනසට සාපේක්‍ෂ කුඩාම ධර්ම වන බව අභිධර්මාර්ථ සංග්‍රහයේ ඉංගිරිසි පරිවර්තනයට පෙරවදනක් ලියමින් බෝධි හිමියන් සඳහන්කර ඇත. ඒ ධර්මවලට පරමාර්ථ ධර්ම යැයි කියනු ලබන්නේ ඒ අර්ථයෙන් මිස මනසින් තොරව පවත්නේය යන අර්ථයකින් නොවන බව පැහැදිලි විය යුතු ය. මනසින් තොරව සංකල්ප නො පවතියි. එබැවින් ලෝකයක් ද නො පවතියි. යම් පුද්ගලයකුගේ ලෝකය යනු ඒ පුද්ගලයාගේ මනසේ නිර්මානය කෙරෙන සංකල්ප හා ප්‍රවාද ආදිය මිස අන් කිසිවක් නො වෙයි.

චිත්තයක් ඇති ළදරුවාට මනසක් වෙයි. මනස යනුවෙන් මනස විසින් ගැනෙන්නේ තමා බැවින් ළදරුවකුට මව්කුසින් බිහිවීමට පෙර සිට ම මම යන සංකල්පය වෙයි. පශ්චාත්ව්‍යුහවාදියකු ලෙස සැලකෙන ලකාන් නමැත්තාගේ පුස් ප්‍රවාදවලට අනුව ඒ එසේ නො වෙයි. ඇතැමුන් විසින් ඊනියා පශ්චාත්නූතනවාදී මනෝවිශ්ලේෂකයකු ලෙස ද හැඳින්වෙන ලකාන්ට අනුව ඉතා කුඩා ළදරුවන්ට මම යන සංකල්පය නැත. ඔහුට අනුව ළදරුවන්ට මම යන සංකල්පය ඇතිවන්නේ අනෙකා යන සංකල්පය ඇතිවීමට පසුව ය. එහෙත් ප්‍රශ්නය වනුයේ අනෙකා යන සංකල්පය ඇතිවන්නේ කාහට ද යන්න ය.

© Prof. Nalin De Silva

අනෙකා යන සංකල්පය ඇතිවිය යුත්තේ යම්කිසි මනසක ය. ගින්නක් නොමැතිව දුමක් නොනගින්නාක් මෙන් මනසක් නොමැතිව සංකල්ප ඇති නො වෙයි. ලකාන් පඬිවරයාගේ මනස්ගාතවලට අනුව මනස ඇතිවන්නේ අනෙකා නම් සංකල්පය කොහේදෝ ඇතිවීමෙන් පසුව ය. අනෙකා යන සංකල්පය ඇතිවන්නේ කොහේදැයි අපට ලකාන් පඬිවරයාගෙන් දැනගැනීමට අවස්ථාවක් නොවීම කණගාටුවට කරුණක් වෙයි. ඔහු මේ වනවිට අභාවප්‍රාප්ත වී ය. ඔහුගේ මෙරට සිටින කසිකබල් අනුගාමිකයන්ටවත් අපට ඒ කියාදිය හැකි ද? අප කියා සිටින්නේ අනෙකා යන සංකල්පය ඇතිවීමට ද මනසක් තිබිය යුතු බව ය.

ඒ මනස විසින් මම යන සංකල්පය ලබා දෙනු ලැබෙයි. මම යන සංකල්පය ළදරුවකුට නොව පටිසන්ධි චිත්තය ඇති වූ අවස්ථාවේ සිට ම මව්කුසේ පිළිසිඳගත් සත්ත්වයකුට ඇතිවෙයි. මව්කුස පිළිසිඳ නොගන්නා දෙවියන් බ්‍රහ්මයන් වැනි සත්ත්වයන්ට ද මනසක් හා මම යන සංකල්පය වෙයි. මම යන සංකල්පය නොමැතිව කිසිම සත්ත්වයකුට සසර සැරිසැරීමක් නැත. වෙනත් අයුරකින් කියන්නේ නම් නිවන් අවබෝධකරගන්නා තෙක් සත්ත්වයනට මනස යන සංකල්පය වෙයි. නිවන් අවබෝධකරගැනීමෙන් පසුව පිරිනිවන්පානා තෙක් මනස හා මම යන සංකල්ප වැරදිබව දනිමින් යොදාගැනීමට සිදුවෙයි. ඒ සෝපාදිශේෂ අවස්ථාවෙහි ය. නිරුපාදිශේෂ ව පිරිනිවන් පෑමෙන් පසු නිවන් දක්නා අවස්ථාවෙහි මම යන සංකල්පය නැතිවෙයි.

ලකාන් පඬිවරයා ඇතුළු බටහිර බුද්ධිමතුන්ට මම යන සංකල්පය ළදරුවකුට ඉතා කුඩා අවධියෙහි නැතැයි තීරණයකිරීමට සිදුවන්නේ ඔවුන්ගේ ක්‍රිස්තියානි සංස්කෘතිය හේතුකොටගෙන ය. ක්‍රිස්තියානි සංස්කෘතියෙනි පුනරුත්පත්තිය යන සංකල්පය ඇත්තේ එක් වතාවකට පමණකි. එය ද මිනිසුන්ට ය. මිනිස්සු මරණයෙන් පසුව අවසන් විනිශ්චය අනුව එක්කෝ ස්වර්ගයේ උපදිති, නැත්නම් අපායේ උපදිති. ඒ කවුරුන් කෙසේ කීවත් නැවත ඉපදීමක් වෙයි. එහෙත් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි එලෙස නැවත උපදින්නේ එක් වතාවක් පමණකි. එමෙන් ම එසේ වන්නේ මරණයෙන් පසුව මිනිසුන්ට ය. වෙනත් සතුන්ට එවැනි පුනරුත්පත්තියක් අහිමිවෙයි.

ක්‍රිස්තියානි සංස්කෘතියට අනුව මිනිසා ඉපදෙන්නේ එයට කලින් වෙනත් භවයක සිට මරණයට පත් වී නොවෙයි. ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිනිස් භවයට පෙර වෙනත් භවයක් නැත. එවිට ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බුද්ධිමතුන්ට මම යන සංකල්පය මිනිසුන්ට ඇතිවන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු දීමට සිදුවෙයි. මේ ප්‍රශ්නයට තවත් පැතිකඩක් ද වෙයි. ක්‍රිස්තියානි සංස්කෘතියට අනුව මිනිසුන් හැරෙන්නට ගව, බලු ආදී වෙනත් සතුන්ට සිතීමට නොහැකි ය. ඒ සතුන්ට ආත්මයක් නො වෙයි. ඒ සත්තු මරණින් පසුව ස්වර්ගයට හෝ අපායට හෝ නො යති. ආත්මයක් නැති, විඥානයක් නැති, මනසක් නැති, සිතීමට නොහැකි මේ අනෙක් සත්තු ගස් වැනි උද්භිද ලෝකයෙහි ජීවීන්ගෙන් වෙනස් නො වෙති.

බටහිර ජීවවිද්‍යාවෙහි මිනිසුන් නොවන සතුන් හා ගස් වැල් ආදිය අතර වෙනසක් නැත්තේත් බටහිර ජීවවිද්‍යාව, ජීවවිද්‍යාව ලෙස ඉගැන්වෙන්නේත් එබැවින් ය. එහි මිනිස්සු සත්ත්වයන් ලෙස නො ගැනෙති. සත්ත්වයාගෙන් පරිණාමය වුව ද මිනිස්සු සතුන්ට වඩා වෙනස් වෙති. මිනිසුන්ට සතුන්ට නැති මනසක් වෙයි. සතුන් මෙන් නොව මිනිස්සු සිතති. මිනිසුන්ට මනසක් වෙයි. මිනිසුන්ට සතුන්ට මෙන් නොව මම යන සංකල්පය වෙයි. මේ අදහස් සියල්ල ඇත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය.

එබැවින් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන්නවුන්ට ඔවුන් ආගමින් ක්‍රිස්තියානි ද නැත් ද, පල්ලි යන්නේ ද නැත් ද ආදී වශයෙන් කුමක් වුවත් මිනිසුන්ට පමණක් මම යන සංකල්පය ඇත්තේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට සිදුවෙයි. එවිට පැනනගින ප්‍රශ්නයක් නම් මිනිසුන්ට මම යන සංකල්පය ඇතිවන්නේ ජීවිතයේ කිනම් අවස්ථාවක ද යන්න ය. එයට පිළිතුරු දීම අද බටහිර මනෝවිශ්ලේෂකයන් යැයි කියාගන්නන් අතින් සිදුවෙයි. ෆ්‍රොයිඩ්, ලකාන් වැනි පඬිවරු මෙවැනි ප්‍රශ්න ගැන උනන්දුවක් දක්වා ඒ සම්බන්ධයෙන් ඇතැම් පිළිතුරු දී ඇත. ඊනියා අනෙකකු ඔස්සේ මම යන සංකල්පය ළදරුවන්ට ඇතිවන බවට ලකාන් පඬිවරයා පිළිතුරක් දී ඇත්තේ, එනම් කතාවක් ගොතාඇත්තේ මෙවැනි පසුබිමක ය.

© Prof. Nalin De Silva

ලංකාවේ උපන්, සිංහල බෞද්ධ සංස්කෘතියක වැඩුණු ඇතැමුන් ක්‍රිස්තියානි සංස්කෘතියක ඇති ප්‍රශ්න හා පිළිතුරු වෙනුවෙන් පෙනී සිටින්නන් බවට පත් වී ඇත්තේත් ඒ පිළිතුරු ප්‍රචාරයකරන්නේත් ඔවුන් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට යට වූ දීනයන් වීම හේතුකොටගෙන ය. මේ දීනයන් අතර උපැවිදි වූවන් ද සිටීමෙන් පෙන්නුම්කරන්නේ බටහිර සංස්කෘතික ආධිපත්‍යයෙහි තරම ය. පැවිදි ඊනියා උගතුන් උපැවිදිකර තම කසිකබල් මතවල වෙළෙඳ නියෝජිතයන් බවට පත්කරගැනීමට තරම් ශක්තියක් බටහිර සංස්කෘතික ආධිපත්‍යයට ඇත.

අද මෙරට පශ්චාත්නූතනවාදී, පශ්චාත්ව්‍යුහවාදී, පශ්චාත්මාක්ස්වාදී ආදී වශයෙන් පෙනී සිටින දීනයෝ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයෙහි යටහත් සේවකයෝ පමණක් ම වෙති. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මිනිසුන්ට මම යන සංකල්පය ඇතිවන්නේ කවදාද යන්න ප්‍රශ්නයක් නො වෙයි. එයට හේතුව සියළු සත්ත්වයන්ට යම් ආකාරයක හෝ මනසක් තිබීම ය. අප පිළිතුරු දියයුත්තේ මිනිසුන්ට මනස ඇතිවන්නේ කවදා ද යන්නට නොව සත්ත්වයනට මනස ඇතිවන්නේ කෙසේ ද ආදී ප්‍රශ්නවලට ය. අප කළ යුත්තේ මනස යන සංකල්පය සඳහා ආකෘතියක් නිර්මානයකිරීම ය.

එහෙත් මෙහි දී කිවයුත්තක් වෙයි. අනුකාරකයෝ වනාහි ඉහත සඳහන් විවිධ පශ්චාත්වාදීහු පමණක් නො වෙති. ජීවය, ප්‍රාණයෙන් වෙන්කර ඊනියා ජීවවිද්‍යාවක් උගන්වන්නෝ ද අනුකාරකයෝ ම වෙති. ඩාවින් පඬිවරයා ක්‍රිස්තියානි ආගමේ සඳහන් මැවුම්වාදයට විරුද්ධව පරිණාමවාදයක් නිර්මානයකළ බවට මතයක් වෙයි. මෙය මුළුමනින්ම වැරදි අදහසක් වෙයි. ඩාවින් පඬිවරයා ද ජීවත්වූයේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. ඔහු ඉදිරිපත්කළ මතය ක්‍රිස්තියානි සංස්කෘතියට විරුද්ධ නො වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නන්ට වුව ද බටහිර දැනුම ක්‍රිස්තියානි සංස්කෘතිය මත පදනම්වන බව තේරුම්ගැනීමට නො හැකිවිය. ඔහු ඩාවිනියානු පරිණාමවාදයෙහි මුල් ප්‍රචාරකයෙක් විය. එපමණක් නො වෙයි. බටහිර මානව විද්‍යාව පිළිබඳ ඔහුගේ වූයේ විශේෂ ලැදියාවකි. ඔහු බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බිහිවූ නවකතා හා කෙටිකතා ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදීමේ මුලිකයා විය. එක් අතකින් ගත්කල මෙරට වත්මන් විවිධ පශ්චාත්වාදීන්ගේ මුත්තා ඔහු විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva